# ජල සම්පත් මණ්ඩලය
## වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
# පුරප්පාඩු

ජල සම්පත් මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති පහත තනතුරු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ගණකාධිකාරී (MM - 1-1) (තනතුරු - 01)

**සුදුසුකම් හා පලපුරුද්ද** : වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසරික මට්ටමේ සුදුසුකම හෝ කළමනාකරණ උපාධිය හෝ වාණිජ උපාධිය හෝ උසස් ජාතික ගිණුම්කරණ ඩිප්ලෝමාව ලබා තිබීම.

**සහ**

ඉහත වෘත්තීය සුදුසුකම් ලබාගත් පසු රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල හෝ පිළිගත් ව්‍යාපාර ආයතනයක ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ විධායක මට්ටමේ (කළමනාකරණ) අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.

### ඉංජිනේරු (සිවිල්) (MM - 1-1) (තනතුරු - 02)

**සුදුසුකම් හා පලපුරුද්ද** : පිළිගත් විශ්වවිද්‍යාලයක සිවිල් ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

**අභ්‍යන්තර සුදුසුකම්** : ජල සම්පත් මණ්ඩලයේ ඉංජිනේරු සහකාර (සිවිල්) කණිෂ්ඨ කළමනාකරණ තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර 5 ක සේවයක් සම්පූර්ණ කර තිබීම

### ප්‍රවාහන නිලධාරී (JM - 1-1) (තනතුරු - 01)

**සුදුසුකම් හා පලපුරුද්ද** : පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය සමඟ රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යාපාර ආයතනයක අදාල ක්ෂේත්‍රයේ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.

**හා**

සියලුම වර්ගයේ වාහන සඳහා වන බර වාහන බලපත්‍රයක් ලබා තිබීම.

### පාලන නිලධාරී (JM - 1-1) (තනතුරු - 01)

**සුදුසුකම් හා පලපුරුද්ද** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය හා රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යාපාර ආයතනයක අවම වශයෙන් වසර එකක සේවා පළපුරුද්ද.

හා

පරිඝණක පාඨමාලා ප්‍රවීණතාව ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**අභ්‍යන්තර සුදුසුකම්** : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 1 පන්තියේ තනතුරක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් ලබා තිබීම.

MS office පරිඝණක මෘදුකාංග පැකේජයෙහි ප්‍රවීණත්වය සහ පිරිස්/මානව සම්පත් කළමනාකරණ සහතිකපත් පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**හෝ**

ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය/පිරිස් කළමනාකරණ ආයතනය හෝ සමාන වූ ආයතනයක පවත්වනු ලබන පිරිස් /මානව සම්පත් කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව නිම කිරීම සමඟ ජල සම්පත් මණ්ඩලයේ කළමනාකරණ සහකාර 11 පන්තියේ අවම වශයෙන් වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MS office පරිඝණක පාඨමාලා ප්‍රවීණතාව ලබා තිබීම අතිරේක සුසුසුකමක් ලෙස සැලකේ.

## ගිණුම් නිලධාරී (JM - 1-1) (තනතුරු - 01)

**සුදුසුකම් හා පලපුරුද්ද** : පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය/ කළමනාකරණ/වාණිජ උපාධිය ලබා තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනය / වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය / සහතිකලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික මට්ටමේ සුදුසුකම

**හා**

ඉහත වෘත්තීය සුදුසුකම් ලබාගත් පසු රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල හෝ පිළිගත් ව්‍යාපාර ආයතනයක ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්ද

**හෝ**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ පූර්ණ සාමාජිකත්වය සමඟ සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල හෝ පිළිගත් ව්‍යාපාර ආයතනයක ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද

ගිණුම්කරණ මෘදුකාංග පිළිබඳව ප්‍රවීනත්වය ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**අභ්‍යන්තර සුදුසුකම්** : කළමනාකරණ සහකාර 1 පන්තියේ තනතුරක ගිණුම්කරණයේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂණ් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය/ ගණකාධිකරණය/ කළමනාකරණය/වාණිජ උපාධිය හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමඟ ජල සම්පත් මණ්ඩලයේ ගිණුම්කරණය/මූල්‍ය ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සම්පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂණ් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය/ කළමනාකරණය/ වාණිජ උපාධිය ලබා තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමඟ ජල සම්පත් මණ්ඩලයේ ගිණුම්කරණය /මූල්‍ය පිළිබඳ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.

පරිඝණක පාටමාලා ප්‍රවීණතාව ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

## ගිණුම් සහකාර (MA - 2-2) (තනතුරු - 02)

**සුදුසුකම් හා පලපුරුද්ද** : ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ හා ව්‍යාපාර සහතිකපත්‍ර අදියර 1 විභාගය සමත්වීම/ ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලා දෙවන වසර විභාගය සමත්වීම/ ශිල්පීය ගණකාධිකාරී ආයතනයේ අවසන් විභාගය සමත්වීම.

**හා**

රජයේ දෙපාර්තමේන්තු/ව්‍යස්ථාපිත මණ්ඩල/ සංස්ථා පිළිගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතනයක වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර සුදුසුකම්** : ජල සම්පත් මණ්ඩලයේ සේවයේ නියුක්ත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍ර අදියර 1 විභාගය සමත්වීම/ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන වසර සමත් වීම/ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අවසන් විභාගය සමත්වීම සමඟ ගිණුම්කරණ/මූල්‍ය කටයුතු වල වසරක සේවා පළපුරුද්ද

## මෝටර් කාර්මික (PL - 3) (තනතුරු - 02)

**(බර වාහන හා යන්ත්‍රෝපකරණ)**

**සුදුසුකම් හා පලපුරුද්ද** : අ පො ස සා පෙළ විෂයන් දෙකකින් සමත්වීම.

**හා**

පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන අදාල ක්ෂේත්‍රයේ වසර දෙකකට නොඅඩු ශිල්පීය ආධුනිකත්ව පුහුණු සහතිකපත්‍ර පාඨමාලාවක් (NVQ 4 මට්ටමට නොඅඩු) සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**පොදු කොන්දේසි**

1. වයස් සීමාව අවුරුදු 21 හා 45 අතර විය යුතුය.

2. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් සඳහා වයස් සීමාවන් බල නොපැවැත්වේ.

3. වැටුප් ගෙවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛ අංක MSD 02/2016 අනුකූලවේ.

4. රජයේ හෝ රාජ්‍ය/සංස්ථා හෝ මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම අදාල ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

5. අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ සඳහන් කල යුතුය.

6. අයදුම්පත සම්පූර්ණ ජීව දත්ත සමග සහතික වල පිටපත් සහිතව තමන්ගේ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග සභාපති, ජල සම්පත් මණ්ඩලය, 2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ - 07, යන ලිපිනයට 2016.08.16 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති**
**ජල සම්පත් මණ්ඩලය,**
**2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,**
**කොළඹ - 07**
**2016.07.28**